# සිංහල

## 5 ශ්‍රේණිය




Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# 11 පාඩම

## ස්ත්‍රී ලිංග බහු වචන පද වැකිවල යොදමු.

### පියවර 1

- ඔන්න අද දවසේ අපි බලමු. ස්ත්‍රී ලිංග බහු වචන පදයක් යෙදුණොත්, නැත්නම් ස්ත්‍රී ලිංග නම් කිහිපයක් යෙදුණොත්, වැකියක අවසාන ක්‍රියාව යොදන්නේ කොහොමද කියලා.

ඔන්න මම ඔයාලට කියල දෙන්නම්. දැන් ඔයාල පහත වැකි හඬ නගා කියවන්න.

1. නැන්දලා කුස්සියට යති.
   ඔවුහු රස කැවිලි සාදති.

2. තිසරි හා මනුකි හොඳ මිතුරියෝ ය.
   ඔවුහු විනෝදය සඳහා චිත්‍ර අඳිති.

- හොඳයි ඔයත් මේ විදිහට වැකි කිහිපයක් ලියල බලමු.

1. අම්මලා දර කඩන්නට කැලයට යති.

   ..........................................................................................................

2. මාලා හා රුවනී උදැසන පාසල් යති.

   ..........................................................................................................

3. නංගිලා මිදුලේ සෙල්ලම් කරති.

   ..........................................................................................................

4. දනුකි, ලිතුමි හා චමුදි සතුටින් ගී ගයති.

   ..........................................................................................................

5. අත්තම්මලා සුදුවතින් සැරසී පන්සල් යති.

   ..........................................................................................................

## පියවර 2

- **සත්ත්ව නාම පදයක් වෙනුවට අපිට "ඌ" යන පදයත්, ද්‍රව්‍ය නාම පදයක් වෙනුවට "එය, ඒවා" යන පදත් යොදන්න පුළුවන්.**

දැන් පහත වැකි හඬ නගා කියවමු.

1. වඳුරු වැටියා මිදුල වටා දුවයි.

   **ඌ මව සොයා යයි.**

2. කුරුල්ලා ගස වටා පියාඹයි.

   **ඌ අලංකාර කූඩුවක් සාදයි.**

3. ගස සුළඟට සෙලවෙයි.

   **එය ඉදිරි වැටෙයි.**

4. නංගී මල් ගවුමක් අඳියි.

   **එය අම්මා මැසූ එකකි.**

5. අහසේ සඳ බබළයි.

   **එය රාත්‍රිය ආලෝකමත් කරයි.**

6. අතීතයේ රජවරු වැව් සෑදූහ.

   **ඒවා ගොවිතැනට උදවු සපයයි.**

7. නංගී ළඟ පැන්සල් බොහෝය.

   **ඇය ඒවා ප්‍රවේශමෙන් භාවිත කරයි.**

8. මල්ලී මුද්දර එකතු කරයි.

   **ඔහු ඒවා පොතක අලවයි.**